**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2013**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන පනතේ) 10(ඇ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පාරිතෝෂික වියදම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.142,883 ක් වැඩියෙන් වෙන් කිරීම් සිදු කර තිබුණි.

#### 2.2.2 පැහැදිළි නොකළ වෙනස්කම්

පරිගණක හා උපාංග ලෙජර් ගිණුමේ ශේෂය රු.15,309,664 ක් වුවද අවසන් ගිණුම්වල රු.15,359,464 ක් ලෙස දැක්වීම නිසා රු.49,800 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීතී රීතී, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතී රීතී, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.3,448,406 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වෙන්කල වාහන හැර ඉතිරි සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

### 2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5(අ) වගන්තිය ප්‍රකාරව “සී” ශ්‍රේණියේ සංස්ථාවක නිල වාහන වෙන්කළ හැක්කේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හා විධායක අධ්‍යක්ෂකවරයන් සඳහා පමණි. එම විධිවිධානවලට පටහැනිව සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයාට සහ අධ්‍යක්ෂකවරුන් 05 දෙනෙකුට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් පමණක් වෙන්කල වාහන ලබාදී සමාලෝචිත වර්ෂයේදි රු.1,241,100 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.3,229,145 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,495,496 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,724,641 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්ක කර තිබූ පහත කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(අ) තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්තීන්, උපක්‍රමයන් ක්‍රමවත්ව සැකසීම විමර්ශනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අංශ 04 ක් යටතේ වැඩසටහන් 44 ක් කිරීමට සැලසුම් කර තිබුණු අතර තථ්‍ය වශයෙන් සිදුකළ ප්‍රමාණය 32 ක් විය. ඒ අනුව ඉලක්කයට ලඟා නොවූ වැඩසටහන් ප්‍රමාණය 12 ක් විය.

(ආ) කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රවාහන අංශයේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු සැලසුමක් සකස් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් එය සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) පළාත් වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමට වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එය සිදුකර නොතිබුණි.

(ඈ) ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ව්‍යාප්ත කිරීම හා පවත්වා ගෙන යාම සඳහා අංශ 05 ක් යටතේ වැඩසටහන් 748 ක් කිරීමට සැලසුම් කර තිබුණ ද සත්‍ය වශයෙන් සිදු කර තිබුණේ 156 ක් පමණි. වැඩසටහන් 592 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා ආපදාවන්ට ලක්වූවන්ට උපකරණ මිලදී ගැනිම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ රු.12,467,374 ක මූල්‍යාධාර ලබාදුන් අවස්ථාවේදිම වියදමක් ලෙස ගිණුම්ගතකර ඇතත් සත්‍ය වශයෙන්ම වැයකර තිබුණේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන පනත ප්‍රකාරව කොමිෂන් සභාව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(i) තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචි වියයුතු වුවත්, එසේ ලියාපදිංචි විය යුතු ආයතන හඳුනාගෙන ලියාපදිංචි කර ගැනීම සඳහා සභාව සතුව ප්‍රමාණවත්වූ වැඩ පිළිවෙලක් නොමැති වීම.

(ii) ලියාපදිංචි කාලය අවසන් වූ ආයතනවල ලියාපදිංචිය නැවත අලුත් කිරීම සඳහා කටයුතු නොකිරීම.

(iii) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතන පිළිබඳව අධීක්ෂණය නොකිරීම හා ලියාපදිංචි නොවූ ආයතන 44 ක් පිළිබඳව පනතේ විධිවිධාන අනුව කටයුතු නොකිරීම.

(ඈ) ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සකස් කිරීමට අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන යටතේ තේ නිෂ්පාදන තාක්ෂණය සහ විලේපන වේදය (Cosmetology)) යන පාඨමාලා සඳහා ජාතික නිපුණතා ප්‍රමිති, 2013 මැයි 30 දිනට ප්‍රථම සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් මාස 2 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා රු.487,073 ක් වැය කර වැඩමුළු 26 ක් පවත්වා තිබුණු අතර මෙම කාර්යය මාස 03 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද මාස 08 ක් ගතවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පර්යේෂණ කටයුතු සඳහා වැයකළ රු.1,184,760 ක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ 09 ක් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබුණු අතර එක් පර්යේෂණයක් අත්හැර දමා තිබුණි. පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීමේදී ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව අධ්‍යනය කර නොතිබුණි.

(ii) කොමිෂන් සභාවේ නිලධාරීන් 05 දෙනෙකු පර්යේෂණ කිරීමට එකග වී තිබුණද ඔවුන් සමග ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) පර්යේෂණ සඳහා ඒ පිළිබඳව නිපුණත්වයක් ඇති විශේෂඥයන් මගින් සිදුකළ යුතු වුවත්, පර්යේෂණ කටයුතුවලට සහභාගී කර ගෙන තිබුණේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්ය මණ්ඩලය පමණි.

(ඉ) අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද නිපුණතා තරගාවලියේ සංවිධාන කටයුතු කොමිෂන් සභාව විසින් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.4,127,802 ක්වූ වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) තරගාවලියේ කටයුතු සඳහා එක් ආයතනයකට රුපියල් මිලියනය බැගින් ආයතන හතරක් වෙත අත්තිකාරම් මුදල් ලබාදී තිබුණද, අත්තිකාරම් ලබාදීමේ කොන්දේසි අනුව එකී ආයතන කටයුතු කර නොතිබුණි.

(ii) එක් ආයතනයක් වෙත ලබාදුන් අත්තිකාරම් මුදල 2014 නොවැම්බර් 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට ලබාදුන් මුදලින් රු.275,574 ක ඉතිරි මුදල කොමිෂන් සභාවට නැවත ලබාදී නොතිබුණි.

(iv) උපකරණ හා පුහුණු ද්‍රව්‍ය මිලදී ගැනීම් අධීක්ෂණයට කොමිෂන් සභාවේ නිලධාරීන් පත්කර තිබුණද, අධීක්ෂණයන් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

**4.3 නිෂ්කාර්ය වත්කම්**

බැංකු ජංගම ගිණුමක රු.2,000,000 කට ආසන්න ශේෂයක් වර්ෂය පුරා පැවති අතර එම ශේෂය සමහර අවස්ථාවල රු.5,000,000 දක්වා ඉහළයාමෙන් මූල්‍යය කළමනාකරණයේ දුර්වලතා පෙන්නුම් කෙරුණි.

**4.4 කාර්යය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 85 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 70 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 16 ක් සහ අතිරික්ත සංඛ්‍යාව 1 ක් විය.

(ආ) 2012 වර්ෂයේ විභාග ඇගයීම් ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කාර්යය මණ්ඩලයට 05 දෙනෙකු බඳවා ගැනීමට අනුමත කර තිබුණද ඔවුන් බඳවාගෙන එම අංශය ස්ථාපිත කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා එක් එක් අංශ අතර උප ඉලක්කයන් නියමිතව දක්වා නොතිබුණු අතර දක්වා ඇති උපාය මාර්ග සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය සහ ඒ සඳහා වූ වියදම් හා ආදායම් දක්වා නොතිබුණි.

**5.2 අයවැය ලේඛන පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුළත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතර, විචලනය සියයට 5 සිට සියයට 117 ක පරාසයක වුයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය කළමණාකරණය
(ඇ) අයවැය පාලනය
(ඈ) සේවක මණ්ඩල කලමනාකරණය